# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/83/2020(NPC)

කේ.එම්.එච්.කේ. කුමාරි ඉලංගකොන්
**අභියාචක**
**එදිරිව**
ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.07.15.**

ඉදිරියේ දී :- විනිසුරු කේ.ඊ.විත්‍රසිරි (සභාපති)
ජේ.ජේ.රත්නසිරි (සාමාජික)
එස්.නන්දසේකරන් (සාමාජික)

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රාජ්‍ය සේවක ඩී.ඇම්.ඇස්.ඩබ්.බී.පට්ටපොල මහතා,
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ මාලා බස්නායක මහත්මිය.

**-නියෝගය-**

## විනිසුරු කේ.ඊ.විත්‍රසිරි මැතිතුමා

කේ.එම්.එච්.කේ. කුමාරි ඉලංගකොන් යන අභියාචක විසින්, 2020.05.14 වෙනි දින මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සම මගින් ඉල්ලා ඇත්තේ, ඇය වෙත පනවා ඇති විනය නියෝගය ඉවත් කර දෙන ලෙසටයි. ඉහත කී විනය නියෝගය මධ්‍යම පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් නිකුත් කර ඇති 2019.06.28 දිනැති ලේඛනයේ සඳහන්ව ඇත. එම නියෝගය හේතුවෙන් අභියාචකගේ වැටුප් වර්ධක එකක් විලම්භනය කර ඇත.

එකී විනය නියෝගය නිකුත් කිරීමට හේතු වී ඇත්තේ, අභියාචකට එරෙහිව නිකුත් කරන ලද චෝදනාවකට ඇය වරදකරු බවට පත් කිරීම හේතුවෙනි. එම චෝදනාව පදනම් වී ඇත්තේ, කිසියම් අපරාධයක් සම්බන්ධයෙන්, දුරකථන සමාගමකින් දුරකථන වාර්තා ලබා ගැනීමේ අදහසින් නිකුත් කරන ලද ලිපියකට, උප පොලිස් පරීක්ෂක ඩී.එච්.එම්.සුරංග දිසානායක නැමැති නිලධාරියාගේ ජංගම දුරකථන අංකය අභියාචකගේ

දැනුම උපයෝගී කරගෙන ඇතුළත් කරමින්, එම දුරකථන තොරතුරු ඇතුළත් වාර්තා ලබාගැනීමට කටයුතු කර තිබීම යන කරුණය. අභියාචක, සුරංග දිසානායක නැමැති නිලධාරියා සමග ප්‍රේම සම්බන්ධතාවයක් පවත්වා ගෙන ගොස් තිබී, පසුව එම සම්බන්ධතාවය නවත්වා ඇත. සුරංග යන අයගේ ජංගම දුරකථන අංකය වෙනත් නිලධාරියෙකු මාර්ගයෙන් ලබා ගැනීමට අභියාචක කටයුතු කර තිබුණ බවට චෝදනා නගා ඇත.

ඉහත කී චෝදනාව සම්බන්ධයෙන් පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණය අවසානයේ දි එම චෝදනාවෙන් අභියාචක නිදහස් කිරීමට විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා තීරණය කර ඇත. එකී විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා ඔහු විසින් ගනු ලැබූ තීරණයට හේතුන් වන්නේ මොනවාද යන්නත් ඔහුගේ වාර්තාවේ පැහැදිලිව සඳහන් කර ඇත. ඉදිරිපත් වූ සියළුම සාක්ෂි ඔහු විසින් විශ්ලේෂණයට ලක් කර ඇත. ඒ ආකාරයට සාක්ෂි විශ්ලේෂණය කරමින් ඔහුගේ වාර්තාව සකසා ඇත.

පො.කො.33652 ජගත් නැමැති සාක්ෂිකරු සාක්ෂි දෙමින් පවසා ඇත්තේ, ඔහු විසින් කිසිම ලිපියක් ඩයලොග් සමාගමට යැවීමට පොලිස් ස්ථානාධිපති වෙත යොමු නොකළ බවත්, කවුරුන් විසින් පොලිස් පරීක්ෂකගේ අත්සන ද සහිතව, ප්‍රශ්න ගත ලේඛනයට ජාතික හැඳුනුම්පත් අංකය සහ දුරකථන අංකය ඇතුලත් කළාද යන කරුණ ඔහු නොදන්නා බවයි.

ඉහතින් සඳහන් පරිදි විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා ඔහුගේ තීරණයට හේතුන් දක්වමින්, විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව, අභියාචක නිදහස් කරන බවට තීරණය කර ඇත. එය එසේ තිබියදී, විනය බලධාරියා විසින් පරීක්ෂණ නිලධාරියාගේ තීරණය නොසළකා හරිමින් අභියාචක වරදකරු බවට පත්කරන බවට තීරණය කර ඇත. විනය නිලධාරියාට ඒ ආකාරයට කටයුතු කිරීමට ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 22:7 උප වගන්තිය යටතේ බලය ලැබී ඇත. එම උප වගන්තිය පහත දැක්වේ.

> "***22:7 උක්ත 22:6 උප වගන්තිය යටතේ විනිශ්චය සභාවක නිගමන සියල්ලම හෝ නිගමන කීපයක් හෝ එක් නිගමනයක් හෝ ප්‍රතික්ෂේප කිරීම නැතහොත් ප්‍රතිශෝධනය කිරීම සිදුකරන අවස්ථාවකදී එම තීරණයට පදනම් කරගනු ලැබූ සියළු හේතු සාධක විනය බලධරයා විසින් අදාළ විනය***

***ගොනුවේ පැහැදිලිවත්, නිශ්චිතවත් සටහන් කර තැබිය යුත්තේය .***"

ඉහත වගන්තිය අනුව විධිමත් විනය පරීක්ෂණයේ නිගමනයන් ප්‍රතික්ෂේප කරනු ලැබූ විනය නිලධාරියා එයට පටහැනි කිසියම් තීරණයකට එළඹෙන්නේ නම්, විනය නිලධාරියාගේ එම තීරණයට පදනම් කරගනු ලැබූ සියළුම හේතු සාධක ඔහු විසින්, විනය ගොනුවේ පැහැදිලිව සඳහන් කර, නිශ්චිතව සටහන් තැබිය යුතුය.

විනය බලධාරියා විසින් එවැනි හේතු මේ අවස්ථාවේ දී සඳහන් කර තිබේ දැයි පරීක්ෂා කරන ලදි. විනය බලධාරියා විසින් නිකුත් කර ඇති 2019.06.28 දිනැති ලේඛනයේ 05 වන ඡේදයේ සඳහන් කර ඇත්තේ,

"***ඉදිරිපත් වූ සියළු කරුණු සළකා බැලීමේ දී පරීක්ෂණ නිලධාරියා විසින් ඉදිරිපත් කර ඇති නිගමනයන් හා මා එකඟ නොවන අතර, ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ, XLVIII පරිච්ඡේදයේ 22:5:1 උප වගන්තිය ප්‍රකාරව චූදිත නිලධාරිනියට එරෙහිව නඟා ඇති චෝදනාව සඳහා වරදකරු බවට තීන්දු කරමි.***" යනුවෙනි.

ඒ අනුව ඔහු විසින් ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ, XLVIII පරිච්ඡේදයේ 22:7 උප වගන්තියට කිසිදු අවධානයක් යොමු කර නැත. එකී වගන්තිය ප්‍රකාරව, විනය පරීක්ෂකගේ තීරණයට එරෙහිව ගනු ලැබූ තීරණය සඳහා වන හේතුන් කිසිවක් සඳහන් කර නැත.

මෙම නීතිමය තත්ත්වය, මෙම අභියාචනය විමසීමට ගත් 2024.12.05 වෙනි දින දී ද සඳහන් කර ඇත. එදින මෙම විනිශ්චය අධිකාරය විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත දන්වා සිටියේ ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ, XLVIII පරිච්ඡේදයේ 22:5:1 උප වගන්තිය යටතේ වන තීරණයට හේතුවක් සඳහන් කර තිබිය යුතුය යන කරුණ සම්බන්ධයෙන් වැඩිදුර උපදෙස් අවශ්‍ය වන්නේ නම්, ඒ පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවෙන් හෝ උපදෙස් ලබා ගත හැකි බවයි. ඒ සම්බන්ධයෙන් කිසිදු විමසීමක් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ගෙන ඇති බවට කරුණු ඉදිරිපත් නොවේ. එයින් පෙනී යන්නේ, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ද, විනය බලධාරියා විසින් කළ යුතුව තිබූ ක්‍රියාවක් ඔහු විසින් නොකර සිටීම, ඔවුන් ද අනුමත කරන බවයි.

ඉහත සඳහන් කරුණු සළකා බලා, මෙම අවස්ථාවේ දී විනය බලධාරියා විසින් ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ, XLVIII පරිච්ඡේදයේ 22:7 උප වගන්තිය යටතේ වන අවශ්‍යතාවයන් සම්පූර්ණ කර නොමැති

බවට තීරණය කරමු. එසේ නම් එකී විනය බලධාරියාගේ නියෝගය ඒ ආකාරයෙන් පවත්වා ගෙන යෑමට හැකියාවක් ලැබෙන්නේ නැත.

ඉහත කරුණු සළකා බලා, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනයට ඉඩදීමට තීරණය කරමු. ඒ අනුව අභියාචකට එරෙහිව නිකුත් කර ඇති විනය නියෝගය වන එක් වැටුප් වර්ධකයක් විලම්භනය කිරීම යන දඬුවම ඉවත් කිරීමට තීරණය කරමු.

ඒ අනුව නිසි පියවර ගන්නා ලෙසට ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත නියෝග කරමු.

ඉහතින් සඳහන් හේතුන් සළකා බලා, අභියාචක වෙත 2019.06.28 දිනැතිව මධ්‍යම/ඌව පළාත ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් නිකුත් කර ඇති "**වැටුප් වර්ධක එකක් විලම්භනය කිරීම**" යන දඬුවම ඉවත් කිරීමට තීරණය කරමු.

කෙසේ වෙතත් මෙම සිද්ධිය සම්බන්ධයෙන් අභියාචක වැඩ තහනමට ලක්ව සිට ඇති අතර, එම කාලය තුළ ඇය රජයට කිසිදු සේවයක් සළසා නොමැති බැවින්, එම කාලපරිච්ඡේදය සඳහා අභියාචකට වැටුප් හෝ වෙනත් කිසිදු දීමනාවකට හිමිකම ලැබෙන්නේ නැත.

ඉහත කොන්දේසි වලට යටත්ව අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනයට අවසර දෙමු.

අභියාචනයට අවසර ලබා දී ඇත.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-